විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

අමාත්‍ය මණ්ඩල සංදේශය

සංදේශ අංකය 05/2017/PE

ගොනු අංකය PE/DEV/02/34/2017 II

## 2017 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

### විදුලි පාරිභෝගිකයන් තම නිවාස/ පරිශ්‍රවල වහල මත ඉදි කරන සූර්ය විදුලි බලාගාර සඳහා ණය පොළී සහන ලබා දීම

1.0 පසුබිම

2016.08.04 දිනැතිව අමාත්‍ය මණ්ඩලය වෙත මවිසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් නිවාස දස ලක්ෂයක සූර්යබල කට්ටල සවි කිරීමේ "සූර්යබල සංග්‍රාමය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ඉල්ලා සිටින ලදී. ඒ අනුව සූර්යබල සංග්‍රාමය ව්‍යාපෘතියේ පාරිසරික, ආර්ථිකමය, සමාජීය බලපෑම සැලකිල්ලට ගෙන එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2016.08.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලැබී ඇත.

මෙම ව්‍යාපෘතිය දැනට සාර්ථකව ක්‍රියාත්මක වන අතර මෙගාවොට් 15ක පමණ ධාරිතාවයක සූර්ය ජනන පද්ධති නිවාස 3000ක පමණ මේ වන විට ඉදි කර ඇත.

"සූර්යබල සංග්‍රාමය" යටතේ නිවාස 1,000,000ක වහල මත සූර්යබල කට්ටල සවි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රම 03කින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත. එනම්,

- ශුද්ධ මනුකරණය (Net Metering)
- ශුද්ධ ගිණුම්කරණය (Net Accounting)
- නෙට් ප්ලස් (Net Plus)

මෙම ක්‍රම 03 යටතේ ශුද්ධ මනුකරණය සහ ශුද්ධ ගිණුම්කරණය යන ක්‍රම අදාල වන්නේ ඉහළ සහ මැදි ආදායමක් ලබන විදුලි පාරිභෝගිකයන් සඳහායි. මෙම විදුලි පාරිභෝගික කාණ්ඩයට තම වහල මත සූර්යබල කට්ටල සවි කොට සූර්යබල සංග්‍රාමයට සම්බන්ධ වීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ඇත. ඔවුන්ට තමාගේ මුදලින් හෝ බැංකු ණය පහසුකම් ලබාගෙන සූර්යබල කට්ටල සඳහා ආයෝජනය කල හැක. නමුත් දැනට මූල්‍ය වෙළඳපොලේ පවතින බැංකු ණය පොළී අනුපාතික ඉහල බැවින් අඩු ආදායම්ලාභී පවුල්වලට රු. 200,000 සිට රු. 400,000 දක්වා ප්‍රමාණයක ණය මුදලක් ලබාගෙන සූර්යබල කට්ටල මිලදී ගැනීමට නොහැක. නෙට් ප්ලස් ක්‍රමය යෝජනා කොට ඇත්තේ එවැනි අඩු ආදායම්ලාභී පවුල් සඳහායි.

රජය 2017 අයවැය යෝජනා තුලින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රචලිත කිරීම ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන ඇත. එමෙන්ම සූර්ය බලය වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රචලිත කිරීම සඳහා රාජ්‍ය මැදිහත් වීමක් ඇතිව සහනදායී පොළියක් මත බැංකු ණය ලබා දීමද අවශ්‍ය බව ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන ඇත.

මේ අනුව 2017 අයවැය යෝජනා අංක 411 මගින් සූර්යබල කට්ටල සඳහා ආයෝජනය කරන විදුලි පාරිභෝගිකයන්ට පොළී සහනයක් ලබා දීමට තීරණය කොට ඇත. එම අයවැය යෝජනාව පහත දැක්වේ.

"අයවැය යෝජනා 411.
මාසික විදුලි බිල්පත රු. 2,000/-ට වැඩි නිවාස සඳහා බලශක්ති අවශ්‍යතාව සූර්ය බලශක්තියට පරිවර්තනය කිරීම ධෛර්යවත් කිරීම සඳහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට බැංකු දිරිමත් කරනු ඇත. මේ සඳහා ණය ලබා ගැනීමේදී රු. 150,000/- දක්වා ගෙවිය යුතු බැංකු පොලියෙන් 50%ක් රජය විසින් දරණු ඇත. මෙම අරමුණ සඳහා රුපියල් මිලියන 1,500ක් වෙන් කිරීමට යෝජනා කරනු ලැබේ."

## 2.0 විස්තරය

ඉහත අයවැය යෝජනාව ඉදිරිපත් කිරීමේදී මාසික විදුලි බිල්පත රු. 2,000ට වැඩි නිවාස සඳහා සහන ණය පොළී අනුපාතික ලබා දීමට යෝජනා වී ඇති නමුත් මෙරට විදුලි පාරිභෝගිකයන්ගෙන් 40%ක ගේ මාසික විදුලි බිල රු. 300ට අඩුය. මේ නිසා අයවැය යෝජනාවේ සඳහන් පරිදි මාසික විදුලි බිල්පත රු. 2,000ට වැඩි නිවාස සඳහා නොව මාසික විදුලි බිල්පත රු. 2,000ට අඩු පාරිභෝගිකයන්ටද මෙම ණය පොළී සහනය විශේෂයෙන් ලබා දිය යුතුය.

එමෙන්ම සාමාන්‍ය නිවසක සවි කරන කිලෝවොට් 2ක (2kW) ධාරිතාවයකින් යුත් සූර්යබල කට්ටලයක් සඳහා අවම වශයෙන් රු. 400,000ක පමණ මුදලක් වැය කළ යුතු වේ. එම නිසා අයවැය යෝජනාවේ දැක්වෙන පරිදි රු. 150,000 දක්වා ණය මුදලක් සඳහා පොළී සහනය ලබා දීම ප්‍රමාණවත් නැත. මේ නිසා මෙම යෝජනාව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට හැකි ආකාරය පිළිබඳව 2017.01.10 දින මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මගේ අමාත්‍යාංශයේ ලේකම් සහ අමාත්‍යාංශ දෙකෙහිම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී.

මෙම සාකච්ඡාවේදී පහත සඳහන් යෝජනා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන ලදී.

## 3.0 යෝජනා

මුදල් අමාත්‍යාංශ ලේකම්ගෙන් හා මාගේ අමාත්‍යාංශ ලේකම්ගෙන් සමන්විත කමිටුව මගින් නිර්දේශ කරන ලද පහත සඳහන් නිර්දේශ පිළිබඳව එකඟ වන අතර එම යෝජනා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

I. ලබාදෙන ණය පොළී සහනය මාසික විදුලි බිල රු. 2,000/-කට වඩා වැඩි ගෘහස්ථ පාරිභෝගිකයින් සඳහා පමණක් සීමා නොකොට සියළුම ගෘහස්ථ පාරිභෝගිකයන් සඳහා ක්‍රියාත්මක කිරීම.

II. රජයේ හෝ ඕනෑම පෞද්ගලික බැංකුවකින් මේ සඳහා ලබා ගන්නා ණය සඳහා ණය පොළී සහනය ලබා දීම

III. ණය පොළී සහනය ලබා දීමට යෝජිත ණය මුදලේ සීමාව රු. 150,000 සිට රු. 350,000ක් දක්වා වැඩි කිරීම

IV. ණය මුදල සඳහා ගෙවන පොළී සහනය ණය ලබා ගන්නා පොළී අනුපාතිකයෙන් 50%ක් හෝ උපරිම ණය පොළී සහනය 6%ක් යන දෙකෙන් අඩු අගයක් ලබා දීම

V. ණය පොළී සහනය ලබා දීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිර්දේශයක් ලබා ගැනීම.

4.0 අනුමැතිය

2017 අයවැය යෝජනා 411 යටතේ යෝජිත සූර්ය බල කට්ටල මිලදී ගැනීම සඳහා ණය පොළී සහන ලබා දීමේ යෝජනාව ඉහත 03හි දක්වා ඇති යෝජනාවල සඳහන් නිර්දේශ සහිතව ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය පතමි.

රංජිත් සියඹලාපිටිය
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය
අංක 72, ආනන්ද කුමාරස්වාමි මාවත
කොළඹ 07

2017 පෙබරවාරි මස ..... දින.